# ශ්‍රී ලංකාවේ බහුලව දැකිය හැකි විෂ සහිත ශාක

විෂ තොරතුරු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා ජාතික රෝහල
කොළඹ

ශාක පරිසර පද්ධතිය තුල වැදගත් ස්ථානයක් හිමි කර ගනී. සමහර ශාක ආහාර, ඖෂධ හෝ විසිතුරු ශාක ලෙස භාවිතා කරයි. එමෙන්ම ඇතැම් ශාක විෂ සහිතය. කුඩා ළමුන් අතර ශාක විෂ වීම් බහුලව දැකිය හැක. මෙම විෂවීම් බොහොමයක් නොදැනුවත්කමින් ශරීරගත වීම නිසා සිදු වන අතර ඇතම් විට මාරාන්තිකද විය හැක.

**බෙහෙත් එඬරු /තෙල් එඬරු -**

**BEHETH ENDARU-** *Ricinus communis*




**විෂ අඩංගු ශාක කොටස** - බීජ

**විෂ** - “රිසීන්” නම් ටොක්ස්ඇල්බියුමිනය. (**Toxalbumin- ricin**)

**වැට එඬරු -WETA ENDARU -** *Jatropha curcas*




ඵලය ඉලිප්සාකාරය, ඉදුණු ඵල තුල කළු පැහැති බීජ ඇත.

**විෂ අඩංගු ශාක කොටස-** ශාකයේ සියළුම කොටස් විෂ සහිතය. ඵලය තුළ වැඩිම විෂ සාන්ද්‍රණයක් අන්තර්ගත වේ.

**විෂ-** කර්සින් (Curcin)

**හොඬල- HONDALA -** *Adenia hondala*




මෙහි ඵලය හා පත්‍ර පැෂන් ශාකයට සමාන වේ. මේ නිසා හදුනා ගැනීමට නොහැකි වීමෙන් ළමුන් අතර හදිසි විෂ වීම් සිදු වීමේ හැකියාව වැඩිය.

**විෂ අඩංගු ශාක කොටස්-** ඵල සහ පත්‍ර

**විෂ-** සයනයිඩ් (**Cyanogenic glycoside**) සහ ටොක්ස්ඇල්බියුමින (**Toxalbumin**)

**නියඟලා- NIYANGALA -** *Gloriosa superba*




සිත් ඇද ගන්නා සුළු වර්ණවත් පුෂ්ප සහිතය.
අල "L" හැඩැතිය.
**විෂ අඩංගු ශාක කොටස** - ශාකයේ සියළුම කොටස් විෂ සහිත අතර, අලවල වැඩිම විෂ සාන්ද්‍රණයක් අඩංගු වේ.
**විෂ** - කොල්චිසීන් නම් ඇල්කලොයිඩය. **(Alkaloid-Colchicine)**

**ඔළිඳ-OLINDA** - *Abrus precatorius*




බීජ තද රතු පැහැවන අතර බීජ ලපය කළු පැහැතිය.
**විෂ අඩංගු ශාක කොටස්** - බීජ
**විෂ-** ඇබ්රින් නම් ග්ලයිකොප්‍රෝටීනය **(Abrin glycoprotein)** සහ ඇබ්රික් ඇසිඩ් නම් වූ ග්ලයිකොසයිඩය **(Abric acid glycoside)**

**දිය කඳුරු-DIYA KADURU** - *Cerbera manghas*




කොළ පැහැති ඕවාලාකාර හැඩැති ඵල ඉදුණු විට කහ පැහැ ගනී. තන්තුමය බාහිරාවරණයක් සහිත ඵලය, අඹ ඵලයට බොහෝ දුරට සමානය.
**විෂ සහිත කොටස්** - සියළුම ශාක කොටස් විෂ සහිත වන අතර ඵල අධික විෂ සහිතය.
සර්බෙරින් ( **Cerberin** ) ඔඩලම් (**Odollum**) සහ තිවෙටින් **( Thevetin)** නම් ග්ලයිකොසයිඩ ( **Glycosides** ) අඩංගු වේ.

**ද්වි කඳුරු -DIVI KADURU** - *Pagiantha dichotoma*




ඵලය යුගල ලෙස පවතී. ඉදුණු ඵල බෝට්ටු හැඩතිය.කහ පාටට හුරු තැඹිලි පැහැතිය..මදය..තද රතු පැහැ පල්පයක් වන අතර එහි බීජ ගිලී පවතී.
**විෂ සහිත ශාක කොටස-** ඵල
**අඩංගු විෂ-** ඇල්කලොයිඩයකි. **(Toxic alkaloid)** අත්තන විෂට සමානය.

**කහ කනේරු- KAHA KANERU**- *Thevetia peruviana*




පුෂ්ප කැපී පෙනෙන තද කහ පැහැතිය. නොමේරූ ඵල කොළ පැහැතිය. මේරූ විට කහ හෝ කළු පැහැ ගනී. ඵලය එයටම ආවේණික වූ ත්‍රිකෝණාකාර හැඩයක් හා ඉහළට එසවුණු දාර තුනකින් යුක්තය. ඵලය තුළ බීජ කිහිපයක් දැකිය හැක.
**විෂ සහිත ශාක කොටස්-** ශාකයේ සියළුම කොටස් විෂ සහිතය. ඵලය තුළ වැඩිම විෂ සාන්ද්‍රණයක් අන්තර්ගත වේ.
**විෂ** - හෘද විෂ අඩංගු ග්ලයිකොසයිඩ (**Cardiac glycosides**)

**අත්තන- ATTANA** - *Datura metel*




ලා කොළ පැහැති ඵලය, ඕවලාකාර හෝ රවුම් හැඩැතිය. තියුණු රෝම සහිතය. පුෂ්ප, සුදු හෝ ලා දම් පැහැයක් ගනී. පුනීලාකාරය. බීජ දුඹුරු පැහැ ගනී.
**විෂ සහිත ශාක කොටස-** බීජ
**විෂ-** "ටොපේන්" ඇල්කලොයිඩ ( **Tropane alkaloids** )

**කැපුම්කිරිය - CORAL PLANT**-*Jatropha multifida*



මෙම ශාක කිරි ඖෂධයක් ලෙස තුවාල සහ වණ වීම් වලට භාවිතා කරයි.

**විෂ සහිත ශාක කොටස්** - ඵල සහ ශාකයේ කිරි
**විෂ-** කර්සින් (Curcin) (Toxalbumin)

## ගොඩ කදුරු -GODA KADURU - *Strychnos nux vomica*





එලය කොළ පැහැතිය. රවුම් හැඩැතිය. මේරූ එලය මෘදුය. තැඹිලි පැහැයක් ගනී. බීජ එයටම ආවේණික වූ එක් පසක් උත්තල හා අනෙක් පස අවතල හැඩයක් ගනී. අළු පැහැතිය.

**විෂ සහිත ශාක කොටස** - බීජ

**විෂ**- උග්‍ර විෂ සහිත ඇල්කලොයිඩ (**alkaloids**) වන සට්‍රිච්නින් (**strychnine**) බෲසීන් (**brucine**) සහ ලොගනින් (**loganin**) අඩංගු වේ.

## හබරල- HABARALA - *Alocasia macrorrhizoS*





සාමාන්‍යයෙන් සෑම ගෙවත්තකම දැකිය හැක.

**විෂ අඩංගු ශාක කොටස්** -කඳ, පත්‍ර, ළපටි පත්‍ර සහ අල

**අඩංගු විෂ** -කැල්සියම් ඔක්සලේට් ස්ඵටික **Crystals of calcium oxalate** සහ වාෂ්පශීලි සංයෝග අඩංගු වේ. මේවාට අධික තාප ප්‍රතිරෝධක හා විබාදක ගුණයක් ඇත.

## වාසනා ගස -LUCKY PLANT – *Zamioculcas zamiifolia*




**විෂ අඩංගු ශාක කොටස්** - සියළුම ශාක කොටස්

**විෂ**- කැල්සියම් ඔක්සලේට් ස්ඵටික Crystals of calcium oxalate

විෂ වීම් "හබරල" ශාකයට සමානය.

## ප්‍රථමාධාර

### ගිලීමකදී

- රෝගියාගේ බිය නැති කරන්න.
- වමනය නොකරවන්න. පොල්කිරි, ලුණු දියර හෝ වෙනත් පාන වර්ග නොදෙන්න.
- රෝගියා සිහිමද ගතියෙන් හෝ සිහිසුන්ව සිටී නම්, වම් ඇලයට හරවා නිකට උස්සා තබන්න.
- රෝගියා වහාම ළඟම ඇති රෝහල කරා රැගෙන යන්න.
- හැකි නම්, විෂ වීමට හේතු වූ ශාක කොටසක්ද හඳුනා ගැනීම සඳහා රෝහල කරා රැගෙන යන්න.

### ඇසේ තැවරුනු විට,

- ඇස ගලායන ජලයෙන් අවම වශයෙන් විනාඩි 15-20 පමණ හොඳින් සෝදා හරින්න
- ඇසට වෙනත් ඖෂධයක් හෝ තෙල් වර්ග නොදමන්න
- වෛද්‍ය උපදෙස් ලබා ගන්න

### සමේ විෂ තැවරුණ විට,

- විෂ තැවරුණ ස්ථාන සබන් යොදා ගලා යන ජලයෙන් හොඳින් සෝදන්න
- වෛද්‍ය උපදෙස් ලබා ගන්න

## සැළකිලිමත් වන්න !

- ශාක, එල සහ ඒවයේ බීජ ළමුන්ට ළඟා විය නොහැකි ලෙස තබන්න / ගබඩා කරන්න.
- ගෙවත්තේ සහ නිවසේ ඇති විෂ සහිත ශාක ඉවත් කරන්න.
- ශාක හෝ ශාක කොටස් මුඛය තුලට නොදමන සේ කුඩා දරුවන් දැනුවත් කරන්න
- විවිධ මල් වර්ග වලින් මල් පැණි උරා බීම සිදු නොකරන ලෙස දරුවන් දැනුවත් කරන්න
- නොහඳුනන විවිධ ශාක හෝ හතු වර්ග සහ ඒවායේ කොටස් ආහාරයට නොගන්න
- නිසි ලෙස හඳුනා නොගත් ශාක හෝ ශාක කොටස් ඖෂධ ලෙස යොදා නොගන්න.

## *Reach us on;*


**Tel:** 011-2686143/ 011-2691111
Ext. 2430

**Email:**npdic.nhs@gmail.com
infotoxlanka@gmail.com

https://www.facebook.com/ NTPICSL

**Web site** http://www.toxbaselanka.info



**Published by the National Poisons Information Centre**